පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂයය :- සිංහල

සතිය -

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

❖ පහත සඳහන් විස්තර කියවා වචන 250 ට නොඅඩු වන සේ රචනා ලියන්න.

01. දිනෙන් දින ලෝකය පුරා ව්‍යාප්ත වන වසංගත තත්ත්වය නිසා සියලු ලෝවැසියෝ භීතියෙන් සිටිති. නමුත් කුඩා දූපතක් වූ අපි ද එයට ගොදුරු වුනෙමු. ලොව බොහෝ ධනවත් රටවල් අසරණ වුවද අපි එවැනි තත්ත්වයට නොවැටුණෙමු. ආදි සංස්කෘතික දායාදල නූතන හා පැරණි සෞඛ්‍ය ක්‍රම හා විනයවත් සමාජ සිරිත් එයට පෙරමුණ ගැණින. එය එසේ වුවද අප හට ද සකසා ගැනීමට බොහෝ කරුණු ඉතිරිව තිබිණි. අනාගතයේ මෙවැනි අවස්ථාවලින් සහමුලින්ම මිදීමට නම්.....

02. පොදු ජනයා ස්වකීය වෙහෙස නිවා ගැනීමට විවේකය ගත කිරීමට හා විනෝදය උදෙසා ඒ අවස්ථාවල යොදා ගත් සාහිත්‍ය විශේෂයක් ලෙස ජන කවි හැඳින්විය හැකිය. ජීවිතයේ විවිධ පැති ගැන වටිනා තොරතුරු ජනකවි ඇසුරින් දක්වා ඇත. අභාවයට යමින් පවත්නා ජනකවි එක් රැස් කර එහි වටිනාකම අනාගත පරපුරට වටහා දී එම සාහිත්‍යය සුරැකීමට කටයුතු කළ යුතු කාලය එළඹ ඇත.

03. මිනිසාගේ පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ දෙවරක් සිතා බැලිය යුතු කාලය පැමිණ තිබේ. අන් අය හා ඇසුරු කිරීමේදී ගමන් බිමන් යාමේදී මෙන් ම සෙනඟ ගැවසෙන ස්ථානවල සිටීමේදී ද මේ පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතුව ඇත. ගෝලීය වශයෙන් අප කරා එනු ලබන විවිධ වෛරසයන්ගෙන් ආරක්ෂා වීමට අපගේ පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂා කර ගනිමු.

04. මිනිස්සු වනාන්තරයෙන් තම අවශ්‍යතා සපුරා ගනිති. අලි ආහාර සොයා ගම් වදිති. වනාන්තර එළි පෙහෙළි කරමින් පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමට මිනිසුන් නිතරම උත්සාහ දරති. අලි ඇතුන් මිනිසාට ප්‍රශ්නයක් වී ඇත්තේ මේ නිසාය. මේ ගැටලුවට තිරසාර විසඳුම් නොමැති වුවහොත් සුන්දර පරිසරය හා සත්ව ප්‍රජාව අපට සදහටම අහිමිව යනු ඇත.

05. වත්මනෙහි නවෝත්පාදනය යන්න විශාල වශයෙන් ජනගත වී ඇත. මේ හේතුව නිසාම නව නිපැයුම් කරමින් අන් සමාජයට දායක වෙමින් සිටී. නව නිර්මාණ බිහි වෙමින් පවතී. එනමුදු ඔවුනට සිය නිර්මාණ සඳහා සැළකිය යුතු වෙළඳපළක් මෙන් ම ඒ පිළිබඳ නිසි ප්‍රවර්ධනයක් නොමැති වීම ගැටලුවක් වී ඇත. මේ පිළිබඳ වගකිවයුත්තන්ගේ අවධානය යොමු වන්නේ නම් නව නිපැයුම් වලින් රට සංවර්ධනය කළ හැකිය.

06. අතීතයේ පටන් අප රට වැසියන් අළුතින් යමක් කිරීමට අළුතින් යමක් සිතීමට හැකියාව ඇති පිරිසක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ නව නිපැයුම් රැසක් ලොවට දායාද කිරීමට අප රටට හැකිවිය. පාසල් මට්ටමේ සිටම විවිධ නිර්මාණයන් නවෝත්පාදකයන් ලෙස ලොව හමුවේ තබමින් අපගේ නව සිතුවිලි ක්‍රියාවට නැංවීම තුළින් අප රට ලොව අංක එකට ගෙන ඒමට හැකි දිනය වැඩි ඈතක නොවේ.